

# මැතිවරණ ව්‍යාපාර වියදම් නියාමනය සහ ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය

**නව මැතිවරණ ක්‍රමයක් - ජනතාවට වගකියන මහජන නියෝජිතයෙක් :**

අද වන විට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සමානුපාතික නියෝජන ක්‍රමය කේන්ද්‍රකරගත් මැතිවරණ ක්‍රමය, කොට්ඨාශ ක්‍රමය මූලික කරගත් මැතිවරණ ක්‍රමයක් ලෙසට වෙනස් කළ යුතුය යන්න මෙරටේ ජනතාව අතර මුල්බැස ගත් අදහසක් බවට පත්ව ඇත. ඊට අමතරව මීළඟ පළාත් පාලන ඡන්ද විමසීම පැවැත්වීමට නියමිතව ඇත්තේ ද කොට්ඨාශ ක්‍රමය පදනම් කරගත් මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් යටතේය.



දැනට ක්‍රියාත්මක සමානුපාතික නියෝජන ක්‍රමයේ කවර සුවිශේෂතා පැවතිය ද කොට්ඨාශ ක්‍රමය කරා නැවත වතාවක් ගමන් කිරීමට තරම් මෙරටේ ජනතාවට බලපෑම් කරන ලද හේතු කාරණා බොහෝ පවතී. සමානුපාතික නියෝජන ක්‍රමයේ අයහපත් ලක්ෂණ විග්‍රහ කරන බොහෝ දෙනෙක් ගෙන එන එක් තර්කයක් වන්නේ දැවැන්ත මැතිවරණ ව්‍යාපාරයක් දියත් කරමින් අසීමාන්තිකව මුදල් වැය කළ හැකි අපේක්ෂකයන් හට ජයග්‍රහණය ලැබීමට එම ක්‍රමය තුළ වැඩි ඉඩක් හිමිවන බවයි. එලෙස ඉතා විශාල ලෙස මුදල් වැයකළ නොහැකි, එහෙත් අවශ්‍යයෙන්ම ජනතාව නියෝජනය කළ යුතු කාන්තා, තරුණ හා වෙනත් ක්ෂේත්‍රයන්හී යම් මෙහෙවරක් කරන ලද පිරිස් මැතිවරණයක් සඳහා තරඟ කරන කලෙක, ඉතා විශාල මුදල් සම්භාරයක් වැය කරන අපේක්ෂකයන් හමුවේ පසුබෑමට ලක්වීමේ යම් සම්භාවිතාවක් පවතීය යන්න බැහැර කළ නොහැකි කරුණකි.

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity
CM EV



ප්‍රජාතන්ත්‍රවාදය අභ්‍යාස කිරීමේ පිළිගත් සෘජු ක්‍රමවේදය වන්නේ ජනතා නියෝජිතයන් තෝරා ගැනීම සඳහා කලින් කලට මැතිවරණ පැවැත්වීමයි. එවැනි මැතිවරණයක් සඳහා ඉදිරිපත් වන තරඟ කරුවන් හෙවත් අපේක්ෂකයන් සඳහා "සම තරඟ බිමක්" (Level Playing Field) වෙනුවට සම අවස්ථා නොමැති තරඟ බිමක් නිර්මාණය වී තිබේනම්, එවැනි තත්ත්වයක් කිසිසේත්ම සාධාරණීකරණය කළ නොහැකිය. එවැනි අවස්ථාවක දී පුරවැසියන් ලෙසින් අප ගතයුතු ක්‍රියාමාර්ග මොනවාද? අපට සමීප වෙනත් රටවල් එවැනි තත්ත්වයන් වළක්වාගෙන ඇත්තේ කවර ආකාරයෙන් ද? මෙම පත්‍රිකාවෙන් උත්සාහ කරනුයේ මෙරටේ සුපිළිපන්න මැතිවරණ ක්‍රියාවලියක් තහවුරු කර ගැනීම සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන් තවදුරටත් සළකා බැලිය යුතු මූලික කරුණක් පිළිබඳව අවධානය යොමු කිරීමයි.

> "හොඳ තරඟකාරීත්වයක්" සහ සමාන අවස්ථා ඇති දේශපාලන පරිසරයක් යන සාධක දෙක අතර මනා සමබලතාවයක් පවත්වා ගැනීම සඳහා අදාළ මූල්‍ය නියාමන රෙගුලාසි තාත්වික හා සාධාරණ විය යුතුය. එහිදී දේශපාලන පක්ෂ, අපේක්ෂකයන් හා පුරවැසියන්ගේ සාධාරණ අවස්ථා අවධානයට ලක් කළ යුතුය. එහිදී ප්‍රචාරණ අමුද්‍රව්‍ය, ප්‍රචාරණ සේවා සහ දැන්වීම් පළකිරීම ආදිය සඳහා වන වියදම සාධාරණ අයුරින් සළකා බැලිය යුතුය". (දකුණු ආසියාවේ දේශපාලන කටයුතු සඳහා මුල් වූ පිරිවැය නියාමන පිළිබඳ නවදිල්ලි ප්‍රකාශනය)

මැතිවරණයකින් ජය ගැනීම සඳහා දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් භාවිත කරන ක්‍රමවේද එකිනෙකට වෙනස් විය හැකිය. එකී උපක්‍රම විද්‍යුත්, මුද්‍රිත හා සමාජ මාධ්‍ය මෙන්ම තොරතුරු තාක්ෂණය ද උපයෝගී කර ගනිමින් ජනගත කිරීමට වැය කරන මුදල් ප්‍රමාණයන් ද එකිනෙකට වෙනස් ය. ලොව විශාලතම ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ මෙහෙයුම සිදුකරන්නේ ඉන්දියාවයි. එරටේ අවසන් වරට එනම් වසර 2014 දී පැවති මහා මැතිවරණය සඳහා ඉදිරිපත් වූ අපේක්ෂකයන් පොදුවේ මැතිවරණ ප්‍රචාරණය සඳහා වැය කර තිබූ මුදල ප්‍රමාණයෙන් ඇ. ඩො. බිලියන 5 ක් විය. එය දෙවැනි වූයේ ඇමෙරිකා එක්සත් ජනපදය ඒ හා සමාන මැතිවරණයකට වැය කරන මුදලට (ඇ.ඩො බිලියන 7 ක්) පමණි.

අප මෙරටේ පවත්වන මැතිවරණයක් තුළදී කවර මුදල් ප්‍රමාණයක් ඒ ඒ දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයන් වැය කර ඇත්දැයි මෙතෙක් නිශ්චිත සමීක්ෂණයක් කවරෙකු විසින් හෝ සිදුකර නැත. සමහර අපේක්ෂකයන්, මෙරටේ අවසන් වරට එනම් වසර 2015 දී පැවැත් වූ මහා මැතිවරණය සඳහා තමන් වැය කළ මුදල් ප්‍රමාණය පිළිබඳ යම් යම් ප්‍රකාශ වරින් වර කරනු ලැබීය.

ඉන් එක් එක් ජයග්‍රාහී අපේක්ෂකයෙක් දැක් වූ පරිදි ඔහුගේ මැතිවරණ ප්‍රචාරක වියදම රුපියල් ලක්ෂ 800කි. එකී මුදලේ විශාලත්වය කෙතරම් ද යත්, මෙරටේ ප්‍රාදේශීය සභා බොහෝ ප්‍රමාණයක් තම බල ප්‍රදේශයේ ජනතාවට සේවා පහසුකම් සැපයීම සඳහා වැය කරනු ලබන වාර්ෂික වියදම රුපියල් ලක්ෂ 800 කට නොවැඩි බව ඉතා පැහැදිලි කරුණකි.

සීමාවක් හෝ පාලනයක් නොමැති මැතිවරණ ප්‍රචාරක වියදම් හමුවේ අභියෝගයට ලක් වන්නේ රටක අනාගත පාලනය බව මේ අනුව පැහැදිලි වන කරුණකි. "එක් පුද්ගලයෙක් - එක් ඡන්දයක්" (one person – one vote) යන සම්මත පොදු මූලධර්මය මින් උල්ලංඝනය වේ. එපමණක් නොව ඊට සමගාමීව මතු වන පහත සඳහන් ගැටලු තුළින් සිදුවන්නේ රටේ මනා පාලනය අභියෝගයට ලක්වීමයි.

- ධනය සම්බන්ධ ලැදියාවන් මගින් දේශපාලන ක්‍රමවේදයට අයථා බලපෑමක් සිදුවීම
- පෞද්ගලික ව්‍යාපාර මැතිවරණ ක්‍රියාදාමයට දායකත්වය ලබාදී, රාජ්‍ය ප්‍රසම්පාදන හා සංවර්ධනය ද ඇතුළත්ව රාජ්‍ය මූල්‍යය ය දූෂණයට මඟ පෑදීම
- රාජ්‍ය දේපළ අවභාවිත කිරීම
- නීති විරෝධී අරමුදල් මගින් දේශපාලනයට බලපෑම් කිරීම
- විදේශ අරමුදල් වල බලපෑම ජාතික දේශපාලන තත්ත්වයන්ට තර්ජනයක් වීමේ හැකියාව
- මැතිවරණ ව්‍යාපාර තුළ අධික ලෙස මුදල් වියදම් කිරීමේ තත්ත්වයන් තුළින් අලුත් දේශපාලන ප්‍රවාහයන්ට නැගී සිටීමට ඇති ඉඩකඩ සීමා කළ හැකි වීම

ලොව ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක යහපැවැත්ම තීරණය වන එක් ප්‍රධාන සාධකයක් වන්නේ එකී සමාජය තුළ දේශපාලනික තීන්දු තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පවත්නා ස්වභාවයයි. ප්‍රජාතන්ත්‍රවාදය වඩ වඩාත් ශක්තිමත් වන්නේ යම් සමාජයක පුරවැසියන් එකිනෙකා අතර නිරන්තර සංවාදයක් පවත්වා ගතහොත් පමණි. ඊට හේතුව ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ප්‍රධානත්වය ඉසිලිය යුත්තේ පුරවැසියා වීමයි.

ජනතා නියෝජිතයන් ලෙස කටයුතු කරණු ලබන දේශපාලඥයන්ට මෙන්ම දේශපාලන පක්ෂ ද පුරවැසියන් සමඟ අඛණ්ඩ සබඳතාවක් පවත්වා ගැනීම මේ අනුව අත්‍යාවශ්‍ය කොන්දේසියකි. මැතිවරණ කාල සමයක් තුළ "ගෙන්ගෙට යෑමේ" සිට තම ප්‍රතිපත්ති ප්‍රකාශ මුද්‍රණය කොට බෙදා හැරීම හරහා මාධ්‍ය මඟින් තම පාක්ෂිකයන් ඇමතීම දක්වා වූ පුළුල් පරාසයක විහිදුණු කාර්යයන් සමුදායක් මේ අනුව ඕනෑම අපේක්ෂකයෙකු අනිවාර්යයෙන් ම ඉටුකළ යුතුව ඇත. ඒ සඳහා මුදල් අවශ්‍ය වේ. මින් පැහැදිලි වන්නේ දේශපාලන තීන්දු තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ මුදල් ද කේන්ද්‍රීය සාධකයක් බවයි. එහෙත් එය නිසි කළමණාකරණයකට ලක්නොකළහොත් දේශපාලන තීන්දු තීරණ ගැනීමේ ක්‍රියාවලිය උඩුයටිකුරු වන්නේ නිරායාසයෙනි. මෙම පසුබිම හොඳින් විමසීමේදී පෙනී යන්නේ මෙහි ආරම්භයේ සඳහන් කරන ලද සංසිද්ධිය පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත් බවයි.

දේශපාලනයෙහි මව්කිරි මුදල් ය - ඇමෙරිකා එක්සත් ජනපදයේ හිටපු ප්‍රකට දේශපාලනඥ ජේස් උන්රු

## දේශපාලන මූල්‍යකරණය (Political Finance) යනු කුමක් ද?

දේශපාලන පක්ෂවලට හෝ ඒවායේ අපේක්ෂකයන් වෙත විධිමත් හෝ අවිධිමත් ලෙස ලැබිය හැකි මූල්‍යමය සහ ද්‍රව්‍යමය ආදායම් මෙන්ම වියදම් මෙනමින් හැඳින්වේ. සමහර විටෙක මෙවැනි ගනුදෙනු මැතිවරණ ව්‍යාපාරයට අදාළ නොවන කාලසීමාවල දී පවා සිදුවිය හැකිය. එමෙන්ම ඒවා මැතිවරණ ව්‍යාපාරයට සෘජුව සම්බන්ධ නොවිය හැකිය. මෙවැනි මූල්‍යමය කටයුතු ක්‍රියාත්මක වන්නේ විවිධ ආකාරවලිනි. එනම්

- ✓ රාජ්‍ය දේපළ අවභාවිතය
- ✓ ඡන්ද මිලදී ගැනීම
- ✓ මැතිවරණ ක්‍රියාවලියේ ක්‍රියාකාරකම් සඳහා මුදල් එකතු කිරීම
- ✓ යම් යම් කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඊට අදාළ වියදම් සඳහා තෙවන පාර්ශවයක් සම්බන්ධ වීම

මැතිවරණ ව්‍යාපාර වියදම් (Campaign Finance) යනු දේශපාලන මූල්‍යකරණයේ තීරණාත්මක සාධකයකි. එහි මූලික වෙනස වන්නේ අදාළ සියලු වියදම් මැතිවරණ ව්‍යාපාර ඉලක්ක කර ගනිමින් සිදුකිරීමයි. දේශපාලන පක්ෂ මඟින් හෝ සමහර විටෙක එවැනි පක්ෂයක් වෙනුවෙන් මැතිවරණ ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා කරණු ලබන වියදම් මීට අයත්ය. දේශපාලන පක්ෂ වල වියදම් වෙන්කොට හඳුනා ගැනීම ඉතා දුෂ්කර කාර්යයකි.

## මැතිවරණ ව්‍යාපාර වියදම් සීමා කළ යුත්තේ ඇයි ?

මැතිවරණ ඇතුළු දේශපාලන කටයුතු සඳහා අද වන විට නැතිවම බැරි අංගයක් බවට පත්ව ඇත්තේ මුදල්ය. ඒ නිසාම මතු වී ඇති ගැටළුකාරී තත්ත්වයන් ද බොහෝ ය. මැතිවරණයකදී මුදල් යොදා ගනිමින් සිදුවන සුලබ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ. මැතිවරණ ව්‍යාපාර වියදම් නිසි ලෙස නියාමනය නොවුණු විට සිදු වන්නේ මුදලේ බලය ඉස්මතු වීම විනා දේශපාලන ප්‍රතිපත්ති නිසිලෙස ප්‍රකාශයට පත්වීම නොවේ.

## මැතිවරණ ව්‍යාපාර වියදම් පාලනය කිරීම නව සංකල්පයක් ද?

මැතිවරණ ව්‍යාපාර වියදම් පාලනය සඳහා මෙරටේ ඊට අදාළ වෙනම ම නීතියක් සම්පාදනය වී නොමැති වීම විශාල අඩුපාඩුවකි. එහෙත් මෙරටේ වසර 1977 ට පෙර පැවති මැතිවරණ තුළදී අපේක්ෂක වියදම් මැතිවරණ කොමසාරිස්වරයා වෙත නිරවද්‍ය ලෙස භාරදීම අත්‍යාවශ්‍ය කොන්දේසියක් විය. 1946 ලංකා පාර්ලිමේන්තු මැතිවරණ ආඥා පනත මගින් මීට අදාළ නීති එකල හඳුන්වා දී තිබිණ. ඊට කදිම නිදසුනක් වන්නේ වසර 1952 මහා මැතිවරණයෙන් වැලිමඩ අසුන ජයගත් මන්ත්‍රීවරයාගේ මන්ත්‍රී ධූරය අහිමි කිරීමට තරම් මැතිවරණ නීතිය එකල දැඩිව තිබීමයි. ඊට බලපෑ ආසන්නත ම හේතුව වී තිබුණේ තම මැතිවරණ වියදම් යථාකල්හි මැතිවරණ කොමසාරිස්වරයාට ඉදිරිපත් කිරීමට අදාළ මන්ත්‍රීවරයා ක්‍රියා කොට නොතිබීමයි. තවත් වරෙක මහනුවර දිස්ත්‍රික්කයෙන් තේරීපත් වූ මන්ත්‍රීවරයෙකුගේ මන්ත්‍රීධූරය අහිමි වූයේ තම ප්‍රතිපත්ති ප්‍රකාශනය දෙමළ බසට පරිවර්තනය කිරීම සඳහා වැය වූ රුපියල් 25 ක පමණ මුදල තම වියදම් වාර්තාවට ඇතුළත් නොකිරීමේ වරදටය.




> මැතිවරණ කටයුතු වලට අදාළ ව සමාන අවස්ථා ලැබෙන ආකාරයේ පරිසරයක් නිර්මාණය කිරීම ඉතාමත් ඉහළ මට්ටමින් දේශපාලන කටයුතු සඳහා මූල්‍යමය භාවිතයන් සම්බන්ධව හඳුනාගන්නා ලද ප්‍රධාන අංශයකි. මින් අදහස් වන්නේ සෑම පක්ෂයකට ම, සෑම අපේක්ෂකයෙකුට ම හා සෑම පුරවැසියෙකුට ම දේශපාලනයෙහි නිරත වීමට සහ තමන් නියෝජනය කරන මතය සමාජගත කිරීමට සම අවස්ථා හිමිවන ආකාරයේ නියාමනයක් හා පහසුකාරකත්වයක් සැළසිය යුතු බවයි. (දකුණු ආසියාවේ දේශපාලන කටයුතු සඳහා මුල් වූ පිරිවැය නියාමන පිළිබඳ නවදිල්ලි ප්‍රකාශනය)

## නීතිමය පසුබිම :


මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාර තුළ පක්ෂවලට හෝ අපේක්ෂකයන්ට ලබාදිය හැති දායකත්වය හෝ වියදම් කිරීම මෙන්ම ඊට අදාළ සීමා කිරීම් පිළිබඳව සම්මත වූ නීතියක් මෙරටේ දැනට බලනොපැවැත්වේ. ඊට පරිබාහිරව ආසන්න වශයෙන් පැවති මහා මැතිවරණයේදී දිස්ත්‍රික් මට්ටමින් 5% කට වඩා ඡන්ද ප්‍රතිශතයක් ලබාගැනීමට සමත් වූ දේශපාලන පක්ෂ සඳහා, එක් ඡන්දයකට ශත 50 ක් බැගින් මුදල් ලබාදීම, ශ්‍රී ලංකා ගුවන්විදුලිය සහ රූපවාහිනිය මගින් ඡන්දදායකයන් ඇමතීමට අදාළ ගුවන් කාලයක් නොමිලේ ලබාදීම වැනි අවස්ථා දේශපාලන පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම් වලට ලබාදී ඇත. ඊට අමතරව මැතිවරණයට අදාළ ලිපි ද්‍රව්‍ය බෙදා හැරීම සඳහා දේශපාලන පක්ෂ ලේකම්වරුන්ට නොමිලේ තැපැල් පහසුකම් ලබාදීම ද දැක්විය හැකිය.











"ශ්‍රී ලංකාව ද පාර්ශවයක් වන දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ දූෂණය වැළැක්වීමට අදාළ වෙනත් යම් ජාත්‍යන්තර සම්මුති ක්‍රියාත්මක කිරීම පිණිස හා ගතයුතු පියවර සඳහා විධිවිධාන සැළැස්විය යුතුය"
(19 වන ආ.ක්‍ර.ව්‍යවස්ථා සංශෝධනය)

දේශපාලන මූල්‍යකරණයක් සඳහා යම් නිශ්චිත නියාමන යාන්ත්‍රණයක් පිළිබඳව සලකා බැලීමේදී ඉහත ව්‍යවස්ථාමය ප්‍රතිපාදනය කදිම ප්‍රවේශයක් ලෙස යොදාගැනීමේ හැකියාවක් ඇත. ඊට අදාළ වඩාත් වැදගත් කරුණක් වන්නේ වසර 2005 දී ක්‍රියාත්මක වූ, වසර 2003 එක්සත් ජාතීන්ගේ දූෂණයට එරෙහි සම්මුතියට (UNCAC) පක්ෂව මුලින්ම අනුමැතිය ප්‍රකාශ කළ එක් රටක් වූයේ ශ්‍රී ලංකාව වීමයි. මැතිවරණ ව්‍යාපාර වියදම් යම් නියාමනයකට ලක්කිරීම සඳහා අද වනවිට ලොව බොහෝ රටවල් උත්සාහ දරමින් සිටින බව නිරීක්ෂණය කළ හැකිය. අපේක්ෂකයන්ගේ වියදම් රජයේ අරමුදලක් මඟින් ලබාදීම ජර්මනිය විසින් සිදු කරනු ලබන අතර දේශපාලන පක්ෂ වලට ලැබෙන ආධාර සහ ඒවා වැය කරන ලද්දේ කවරාකාරයෙන් ද යන්න බ්‍රිතාන්‍ය දේශපාලන පක්ෂ, ජනතාවට දැනුම් දිය යුතුය. ඉන්දියාව ද මැතිවරණයේදී ලබන ඡන්ද ප්‍රමාණය අනුව රජය මගින් වියදම් ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබයි. ස්කැන්ඩිවේනියානු රටවල් බොහොමයක්, දේශපාලන පක්ෂ වල මැතිවරණ ප්‍රචාරය සඳහා රජයේ අරමුදල් ලබාදීම සිදුකරනු ලබයි.

පහත සටහන මඟින් දක්වා ඇත්තේ තෝරාගත් රටවල් කිහිපයක එරටේ පැවැත්වෙන ප්‍රධානතම මැතිවරණවල දී එක් අපේක්ෂකයෙකුට වියදම් කළ හැකි මුදල් ප්‍රමාණයේ සීමාව සහ දේශපාලන පක්ෂයකට වියදම් කළ හැකි මුදල් ප්‍රමාණයේ සීමාවයි.

වියදම් සීමා කිරීම :

| **රට** | **දේශපාලන පක්ෂයකට වියදම් කළ හැකි ප්‍රමාණයේ සීමාවක් තිබේ නම් සීමාව කුමක් ද?** | **අපේක්ෂකයෙකුට වියදම් කළ හැකි ප්‍රමාණයේ සීමාවක් තිබේ නම් වියදම් සීමාව කුමක් ද?** |
|---|---|---|
| බංගලාදේශය | අපේක්ෂකයන් සංඛ්‍යාව 200 ක් හෝ ඊට වැඩි නම් උපරිම ටකා මිලියන 45 (1,770,000) කි, අපේක්ෂකයන් 101-200 ත් අතර නම් උපරිමය ටකා මිලියන 30 (1,180,00)කි, අපේක්ෂකයන් 51-100 ත් අතර නම් ටකා මිලියන 15 (588,000) කි. අපේක්ෂකයන් 50 ක් හෝ ඊට අඩු නම් උපරිමය ටකා මිලියන 7.5 (294,000) ක් වන අතර අපේක්ෂකයෙකු සඳහා පක්ෂයකට වියදම් කළ හැකි මුදල ටකා මිලියන 1.5 (59,000) නොඉක්මවිය යුතුය | ඡන්ද කොට්ඨාශයක එක් අපේක්ෂකයෙකු සඳහා උපරිම ටකා මිලියන 1.5 (59,000) කි. මැතිවරණ වියදම් පදනම් විය යුත්තේ ඡන්ද කොට්ඨාශයක සිටින මුළු ඡන්දදායකයන් සංඛ්‍යාව මතය. |
| කාම්බෝජය | අදාළ නොවේ | අදාළ නොවේ |
| ඉන්දියාව | අදාළ නොවේ | මධ්‍යම රජය විසින් නිගමනය කරනු ලැබේ. සීමාව නියම කරන්නේ මැති-වරණ කොමිසමේ අදහස් විමසා මධ්‍යම රජය විසිනි. |
| ඉන්දුනීසියව | අදාළ නොවේ | අදාළ නොවේ |
| නේපාලය | සීමාව නියම කරන්නේ මැතිවරණ කළමණාකරන ආයතන (EMB) විසිනි. | උපරිම සීමාව (මැතිවරණ) කොමිසම විසින් නියම කරනු ලබන්නේ ය. |
| පාකිස්තානය | අදාළ නොවේ | ජාතික රාජ්‍ය සභා මැතිවරණ සඳහා රුපියල් 1,500,000 (51,000) පළාත් මන්ත්‍රණ සභා මැතිවරණයක් සඳහා රුපියල් 1,000,000 (34,000) |
| ශ්‍රී ලංකාව | අදාළ නොවේ | අදාළ නොවේ |


මැතිවරණ ව්‍යාපාර වියදම් නියාමනයට අදාළ විවිධ අන්දමේ ජාත්‍යන්තර මැදිහත්වීම් රාශියක් මේ වන මේ වන විට ක්‍රියාත්මකය.

ඉන් වසර 2015 දෙසැම්බර් 16 වන දින ප්‍රකාශිත දකුණු ආසියාවේ දේශපාලන මූල්‍යකරණ නියාමනය පිළිබඳ නවදිල්ලි ප්‍රකාශනය ඉතා කාලෝචිත උත්සාහයකි. මැතිවරණ කාලය තුළ මෙන්ම ඉන් බැහැරවත් දේශපාලන මූල්‍යකරණ නියාමනයන් හඳුන්වාදීමේ දී සලකා බැලිය යුතු මූලධර්ම හා භාවිතයන් එහි අන්තර්ගතකර ඇත. ඊට අමතරව දකුණු ආසියානු මැතිවරණ බලධාරීන්ගේ සංසදය ද (FEMBoSA) මැතිවරණ ප්‍රචාරක වියදම් යම් නියාමනයකට ලක් කිරීමට අදාළ කටයුතු සඳහා තම උපරිම සහාය පළ කරමින් සිටී.

**මැතිවරණ කොමිෂන් සභාව :**

නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට අවශ්‍ය පුළුල් බලතල වලින් සමන්විතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන මගින් ස්ථාපිතව ඇති මැතිවරණ කොමිෂන් සභාව පිළිබඳව මෙරටේ ජනතාව තුළ ඇත්තේ ඉමහත් ප්‍රසාදයකි. විශේෂයෙන්ම සියලුදෙනා ඇතුළත්කර ගන්නා මැතිවරණ ක්‍රියාවලියක් තහවුරු කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව මෑතකාලීනව ගන්නා ලද බොහෝ ක්‍රියාමාර්ග ඉතා

ප්‍රශංසාත්මකය. මේ අනුව මැතිවරණ ව්‍යාපාර වියදම් පිළිබඳ යම් නියාමනයක් කිරීමේදී මැතිවරණ කොමිෂන් සභාවට කළ හැකි කාර්යභාරය ඉමහත්ය. දැනටමත් මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණයට අදාළ නියාමනයන් හඳුන්වාදීම තම ප්‍රමුඛතම ඉලක්ක වලින් එකක් බවට තම උපාය මාර්ගික සැළැස්මේ දී හඳුනාගෙන ඇත. අනාගතයේ දී සිදුකිරීමට නියමිත එවන් කාර්යයකදී නීතිපති දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වඩාත් පුළුල්ව සම්බන්ධ කර ගැනීම එහිලා ඉතා වැදගත්ය.


වත්කම් හා බැරකම් ප්‍රකාශය

சொத்துக்களேயும் பொறுப்புக்களேயும் வெளிப்படுத்துதல்

DECLARATION OF ASSETS AND LIABILITIES

1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත

1988 ஆம் ஆண்டின் 74 ஆம் இலக்கச் சட்டத்தினல் திருத்தப்பட்டவாருன 1975 ஆம் ஆண்டின் 1 ஆம் இலக்கச் சொத்துக்களேயும் பொறுப்புக்களேயும் வெளிப்படுத்தற் சட்டம்

Declaration of Assets and Liabilities Law No. 1 of 1975 as amended by Act No. 74 of 1988

**අනාවරණය කිරීම :**

මැතිවරණ ව්‍යාපාර වියදම් පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ඉතා වැදගත් මූලධර්මයක් වන්නේ අනාවරණයයි. මුදල් ලබාගැනීමේ මාධ්‍ය ලෙස කටයුතු කරන පාර්ශවය සහ මැතිවරණ ක්‍රමය මෙහිදී අනාවරණය කිරීමේ වගකීම දැරිය යුතුය. එහිදී අනාවරණය කරන ගිණුම්, දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයන් ස්වාධීනව විගණනය කළ යුතුය. තවද මැතිවරණ ව්‍යාපාර සඳහා පරිත්‍යාග කරන පාර්ශව වාර්තා කිරීම සඳහා දිරිගැන්වීම ද වැදගත්ය. අවශ්‍ය නම් ඊට බදු අනුබල (Incentives) පවා ලබාදීමේ වරදක් නැත. අනාවරණය කිරීමේදී ඉතා තීරණාත්මක වන්නේ ආධාර දුන්නේ කවුද, කොතරම් මුදලක් ප්‍රදානය කරන ලද්දේ ද, කවරෙකු හට කුමන පරමාර්ථයක් සඳහා ද ආදී කරුණු නිවැරදිව දැක්වීමයි. එලෙස අනාවරණය කළ යුතු කාලසීමාව කුමක්ද යන්න ගැඹුරින් සළකා බැලීම ද වටී. කෙසේ වුවත් මෙරටේ පසුවිපරම් යාන්ත්‍රණ එතරම් කාර්යක්ෂම ව ක්‍රියාකරන බවට වන විශ්වාසය ඉතා අඩු බැවින් අනාවරණය කිරීම මැතිවරණ කාලසීමාව තුළදී ම සිදු කිරීම වඩාත් ඵලදායී විකල්පයක් වනු ඇත. අවශ්‍ය වන්නේ නම් යම් ව්‍යතිරේකයන් දැක්විය හැකිය. අයර්ලන්තය, රුසියාව වැනි රටවල අනාවරණය කිරීම සිදු කළ යුත්තේ අනුමත සීමාවන් ඉක්මවා යන විටදී පමණි.

**මිත්‍යා මත :**

- වියදම් සීමාව මගින් පුද්ගල ප්‍රකාශන නිදහස උල්ලංඝනය වේ.
- යම් තනතුරක් දරන පුද්ගලයෙකුට ඇති පිළිගැනීම තුළ, වැඩි මුදල් ලබා ගැනීමේ අවකාශයක් ඔහුට හෝ ඇයට ඇත. ඒ නිසා වියදම් සීමාව ඔවුන්ගේ කටයුතු පහසු කරයි.
- ජනතාව වෙත පණිවුඩය ගලායාම සිදුවන්නේ මන්දගාමීවය.

ඉහත දැක්වූ බොහෝ කරුණු කිසිදු තර්කානුකූල පදනමකින් බිහි වූ ඒවා නොවේ. කවර සීමාවක් පැනවීමෙන් වුවද තවත් අයෙකු යම් වාසියක් ගැනීම සාමාන්‍ය ස්වභාවයයි. එහෙත් ඉහත මිථ්‍යා මත දුරු කළ හැකි හොඳම මාර්ගය වන්නේ එක් එක් ආසන හෝ දිස්ත්‍රික්ක තුළ තරඟ කිරීම සඳහා වැය වන මුදල පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණයක් පවත්වා ඉන් අනතුරුව සීමාවන් තීරණය කිරීමයි.

**අවස්ථා :**

තොරතුරු දැනගැනීමේ පනත මෙරටේ බලාත්මක වී තිබීම මැතිවරණ ව්‍යාපාර වියදම් පිළිබඳ මහජන අවධානය වඩාත් පුළුල් කිරීම සඳහා යොදාගත හැකිය. දැනටමත් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය මෙරටේ ප්‍රධාන දේශපාලන පක්ෂ වාර්ෂිකව මැතිවරණ කොමිෂන් සභාව වෙත ලබාදෙන මූල්‍ය වාර්තාවන්හි පිටපත් ලබාගැනීමට ක්‍රියාකර ඇත.

**වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය :**

මෙම නීතිය වඩාත් ප්‍රායෝගික තලයට ගෙනඒම සඳහා කැපවූ ක්‍රියාධරයන්ගේ අදහස වන්නේ, මෙරටේ දැනට පවත්නා බලවත් ම නීතීන් අතුරින් එකක් වන්නේ මෙය බවයි. එය ඕනෑම දේශපාලඥයෙක් පරීක්ෂා කළ හැකි කදිම මෙවලමකි. එහෙත් මෙය අද දක්වා ම මෙරටේ භාවිත වන්නේ ඉතා අක්‍රීය එකක් ලෙසිනි. එකී නීතියේ පවත්නා ආවේණික දුබලතා ඉවත්කිරීම ඉතා කාලීන අවශ්‍යතාවක් ව පවතී. තවද අපේක්ෂකයන් විසින් භාරදෙනු ලබන මෙකී ප්‍රකාශ මෙතෙක් පැවතියේ අභිරහස් ලේඛන විශේෂයක් ලෙසිනි. අදාළ පාර්ශව වෙත ලබා දෙන වත්කම් හා බැරකම් ප්‍රකාශ ඊට සමගාමීව ස්වේච්ඡාවෙන් ජනතා පරිශීලනයට විවෘත කිරීම සඳහා ඉදිරිපත් වීමට තරම් දියුණු දේශපාලන සංස්කෘතියක් බිහිකර ගැනීම අද අප හමුවේ පවත්නා තවත් ප්‍රධානතම අභියෝගයකි. ඊට අමතරව මෙකී ප්‍රකාශ ලබා ගැනීමට පමණක් නොව ඒවා ප්‍රකාශයට පත් කරමින් ඒ පිළිබඳ සමාජ කතිකාවක් ගොඩනැංවීමට අවැසි පරිසරය මෙරටේ පුරවැසියන් හට ලබා දිය යුතුය. මෑතදී සම්මත වූ තොරතුරු දැනගැනීමේ පනත මෙරටේ සමාජ හා දේශපාලන අභිවෘද්ධිය සඳහා දායක කර ගත හැකි එක් ප්‍රගතිශීලී පියවරක් වන්නේ මෙකී නිදහස ශ්‍රී ලාංකීය පුරවැසිය හට ප්‍රදානය කිරීම මඟිනි.

**ඉදිරි පියවර :**

මෙරටට සර්වජන ඡන්ද අයිතිය ලැබී මේ ගෙවී යන්නේ අටවැනි දශකයයි. මැතිවරණ කිහිපයක දී මතු වූ යම් යම් සිද්ධීන් කිහිපයක් හැරුණු විට ශ්‍රී ලංකාවට අනන්‍ය වූ ඉතා සාඩම්බර මැතිවරණ ඉතිහාසයක් පවතින අතර කවර මාදිලියක හෝ මැතිවරණ ප්‍රතිසංස්කරණයකට අදාළ කරුණක් වේද එය සිදු විය යුත්තේ මෙරටට ආවේණික වූ සම්ප්‍රදායන් ගුරු කොට ගනිමිනි. මෙතෙක් ලොව කිසිදු රටක පරිසමාප්ත මැතිවරණ ක්‍රමයක් බිහි කොට නැත. ඒ අනුව මැතිවරණ ව්‍යාපාර වියදම් ද යම් නියාමනයකට නතු කළ යුත්තේ මෙරටේ වර්තමාන දේශපාලන පසුබිම පිළිබඳ පූර්ණ අවබෝධයකින් යුක්තවය. ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාව, දේශපාලන පක්ෂ, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ පුළුල් සහභාගීත්වයෙන් සිදුවන සාකච්ඡා මාලාවක් තුළින් යම් නියාමන ක්‍රමවේදයක් සකස් විය යුතුව ඇත. එවැනි නීතිමය කාර්යයකදී පහත කරුණු කෙරෙහි ද අවධානය යොමු කිරීම වැදගත් ය.







- දේශපාලන පක්ෂවල අපේක්ෂකයන්ගේ වත්කම් හා බැරකම් වලට අදාළ මූලික කරුණු හඳුන්වාදෙනු ලබන කවර හෝ නියාමන ක්‍රමයක මූලික පදනම බවට පත්විය යුතුය.
- හඳුන්වාදෙනු ලබන කවර නියාමන ක්‍රමයක් හෝ වේවා එය දේශපාලඥයන් ඡන්දදායකයාගෙන් ඈත් කරනු ලබන්නක් නොවිය යුතුය. එවැන්නක් හරහා නිදහස් අදහස් ප්‍රකාශනයට බාධා නොපැණවීම අත්‍යාවශ්‍ය සාධකයකි.
- මුදල් යනු වගකීම් සහගත දේශපාලනයක නියැලීම සඳහා ලැබෙන වරප්‍රසාදයක් බව දේශපාලඥයන්ට ඒත්තු ගැන්විය යුතුව ඇත. ඒ අනුව ඡන්දදායකයා සහ දේශපාලඥයා යන දෙපාර්ශවයට ම එකඟවිය හැකි ක්‍රමවේදයක් දක්වා සාකච්ඡා කිරීම හා වෙනත් ජාත්‍යන්තර ක්‍රමවේද තුළ පවත්නා යහපත් පරිචයන් පිළිබඳව සළකා බැලීම ද ඉතා වැදගත්ය.

**විශේෂ සටහන :**


මෙම පත්‍රිකාව සකස් කිරීමේදී පහත නම් සඳහන් පර්යේෂන පත්‍රිකා සහ ප්‍රකාශනවල සඳහන් සමහර කරුණු උපයෝගී කරගෙන ඇත.

ශ්‍රී ලංකාවේ මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය පිළිබඳ කෙටි හැඳින්වීමක් - ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය

දේශපාලනයෙහි මුදල් පාලනය කිරීම පිළිබඳ හැඳින්වීමක් - ආචාර්ය මැග්නස් ඕමන්, ප්‍රකාශනය, International Foundation for Electoral Systems

Funding of political parties and Election Campaigns -A Handbook on political Finance - ප්‍රකාශනය, (International Institute for Democracy and Electoral Assistance 2014



සංස්කරණය : මංජුල ගජනායක

ප්‍රකාශනය : මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)

අනුග්‍රහය : ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය


වැඩි විස්තර සඳහා පහත වෙබ් අඩවි වෙත පිවිසෙන්න.

www.cmev.org

www.tisrilanka.org

www.campaignfinance.lk